**ලාහුගල ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**---------------------**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සභාවේ පුස්තකාල පොත් 1,537 ක් අස්ථානගතවී ඇති බව අනාවරණය වී තිබුණු අතර, එම පොත්වල වටිනාකම තක්සේරු කර ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් මාසයේ ඇතිවූ ගංවතුරින් විනාශ වූ පානම මහජන පුස්තකාලයේ පැවති පොත්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආදායම් පරීක්ෂක විසින් බැංකුවට සෘජුව තැන්පත් කරන ලද රු.18,435 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට පොදු ලෙජරය අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.142,379,662 ක් වූවත්, ශේෂ පත්‍රයේ වටිනාකම රු.144,866,662 ක් ලෙස, රු.2,487,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂයක් පොදු ලෙජරය අනුව නොමැති වූවත්, ශේෂ පත්‍රයේ රු.23,565,941 ක් ලෙස දැක්වීම නිසා ශේෂ පත්‍රයේ හිමිකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට අතරුදවුම් ගිණුමේ ශේෂය පොදු ලෙජරය අනුව රු.1,528,086 ක් වුවත්, ශේෂ පත්‍රයේ අතරුදවුම් ලෙස රු.1,938,960 ක් දැක්වීම මගින් ජංගම වගකීම් රු.410,874 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සභාවට අයිති රු.17,141,884 ක් වටිනා කැබ් රථය, කෘ කැබ් රථය සහ ටිපර් රථයේ වටිනාකම් දක්වා නොතිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සභාවට අයිති වටිනාකම හඳුනාගත නොහැකි ට්‍රැක්ටර් රථයේ සහ ට්‍රේලරයේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ලංකා බැංකුවේ ජංගම ගිණුමේ ආරම්භක ශේෂය මුදල් පොතට අනුව රු.294,368 ක් ලෙස පැවතිය ද, ගිණුමේ වටිනාකම රු.2,794,368 ක් ලෙස රු.2,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සභා බල ප්‍රදේශයේ පවතින දුරකථන කුළුණු වලින් 2016 වර්ෂය සඳහා ලැබිය යුතු රු.27,000 ක වෙළෙඳ බලපත්‍ර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2016 දෙසැම්බර් 31 දිනට විගණනයේදී ලබාගත් තොරතුරු අනුව සභාව සතු ආයෝජන කිසිවක් නොමැති වුවද, ශේෂ පත්‍රයේ ආයෝජන ලෙස රු.1,174,478 ක් දැක්වීම තුලින් ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ප්‍රාදේශීය සභා රීති 180 | ප්‍රාදේශීය සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය හා චෙක්පත් නිකුත් කිරීමට අදාල නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කරන ලද වටිනාකම රු.18,254 ක් වූ මාස 06 ඉක්මවූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 371 | 1988 සිට 2012 වර්ෂය දක්වා කාල සීමාව තුල නිකුත් කර තිබූ රු.86,066 ක් වටිනා අත්තිකාරම් 10 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 389 (ආ) | ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව චෙක්පතක් භාරදී තිබුණි. |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.637,363 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 07 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1647 (ඉ) | සභාවේ වාහන 21 ක් සම්බන්ධයෙන් වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1646 | වාහන 12 ක් සම්බන්ධයෙන් මාසික ගමන් පිළිබඳ සාරාංශයක් හා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව රු.162,535,506 ක් වටිනා ස්ථාවර වත්කම් පැවතිය ද එය ඇතුලත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| 2002 නොවැම්බර් 28 දිනැති IA/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව පරිගණක 09 ක් පැවතිය ද සභාව විසින් පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි |

| | | |
|---|---|---|
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | සභාව සතු කිසිදු වාහනයක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.647,966 ක පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදමක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,490,626 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,138,592 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පුනරාවර්තන ආදායම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු හා වෙනත් ආධාර යන මූලාශ්‍ර සියයට 26 සිට සියයට 1,593 දක්වා පරාසයක වර්ධනයක් ද, දඩ හා වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් යන මූලාශ්‍රවල සියයට 33 සිට සියයට 77 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා ආධාර යන මූලාශ්‍රවල සියයට 13 සිට සියයට 311 දක්වා පරාසයක වර්ධනයක් ද, ගමන් වියදම්, ප්‍රවාහන සම්බන්ධතා, හා විශ්‍රාම වැටුප් යන වියදම් මූලාශ්‍රවල සියයට 07 සිට සියයට 54 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කුලී ආදායම් | 750,000 | 912,292 | 200 |
| බලපත්‍ර ගාස්තු | 205,000 | 138,500 | 26,783 |
| සේවා සඳහා ගාස්තු | 295,000 | 40,906 | - |
| දඩ හා වරෙන්තු ගාස්තු | 2,505,000 | 897,577 | - |
| වෙනත් ආදායම් | 625,000 | 226,155 | - |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ පැවති දුරකථන කුළුණු 09 න් 08 ක් සඳහා 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් රු.160,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

(ආ) එම දුරකථන කුළුණු 09 සඳහා 2016 වර්ෂයට අයවිය යුතු රු.27,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් ලැබිය යුතු රු.26,563 ක මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් පුස්තකාලයන්හි 2014 දෙසැම්බර් වර්ෂය අවසන් වන විට පොත් 1,537ක් අස්ථානගත වී ඇති අතර, එම පොත් වලින් වටිනාකම හදුනාගත හැකි පොත් 1,040 ක වටිනාකම රු.94,7645 ක් විය. නමුත්, එයට අදාල වගකිවයුතු නිලධාරින්ට විරුද්ධව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 11 කට පෙර සිට අපහරණය කිරීමට භාණ්ඩ සමීක්ෂණ කමිටු විසින් නිර්දේශ කර ඇති පොත් 933 ක් අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) අළුත්වැඩියා කටයුතු සඳහා 2010 වර්ෂයේ ගරාජයක් වෙත යවා තිබුණු වතුර බවුසරය නැවත සභාවට ලැබී නොතිබුණ ද, ඒ පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට සේවකයන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.14,200 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2010 වර්ෂයේ සිට මුද්දර ගාස්තු ලෙස අයකරගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.85,103 ක් ගෙවීම් නොකර මේ වනතුරු රඳවාගෙන තිබුණි.

(ඊ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 16 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. වාහන අයිතිය මාරු කිරීම සඳහා 2016 වර්ෂයේ නිදහස් කාලයක් ලබා දුන්න ද එම කාලය තුල අයිතිය පවරා ගැනීම සිදු නොකිරීම නිසා එක් වාහනයකට ප්‍රමාද වන එක් දිනකට රු.100 බැගින් දඩ මුදලක් අයකරන බැවින් වසරකට රු.584,000 කට ආසන්න දඩ මුදලක් මෙම වාහන වල අයිතිය පවරා ගැනීමේදී දැරීමට සිදුවිය හැක.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ධාවන මට්ටමේ පවතින වාහන 14 න් වාහන 05 ක් සඳහා පමණක් ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගෙන තිබූ අතර ඉතිරි වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ආ) 2013, 2014 හා 2015 යන වර්ෂයන්ට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අනුව, පොදු 49 ආකෘතිය යටතේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මේ වනතුරු සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු වාහන 07 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයක පැවතියද, මේ දක්වා අළුත්වැඩියා කිරීමකින් තොරව සභා පරිශ්‍රයෙහි ගාල් කර තිබුණි.

(ඈ) පුරනැඟුම ව්‍යාපෘති යටතේ රු.මිලියන 4.2 ක් වියදම් දරා ඉදිකරන ලද ලාහුගල වෙළඳ සංකීර්ණයේ වැඩ 2016 දෙසැම්බර් 22 වන දින වන විට අවසන්කර තිබුණ ද මේ වනතුරු විවෘත කර නොතිබුණි. තවද, මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රජාපාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීමේ දී නිශ්චිත කාලච්ඡේදයක් තුල සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව 03 කට වඩා නොවැඩි විය යුතු අතර, කොන්ත්‍රාත්වල මුළු වටිනාකම් වල එකතුව රු.මිලියන 02 නොඉක්ම විය යුතු වුවද,සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.13,962,593 ක් වූ ව්‍යාපෘති 08 ක් එකම සමිතියකට කොන්ත්‍රාත් ලබාදී තිබුණි.

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 07 සිට සියයට 172 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුව ඇත.

| | **පද්ධතිය** | | **අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය** |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර ගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම. |
| (ආ) | අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල කිරීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත කිරීම. |